මව්රට දැන් ඉරිදා
2026 ජූලි 26

# හාට්

හදවත් හිරවෙච්චන් තැන... HEART




## Tharindi Fernando

Click by **NEXUS Photography**

# දඟකාර කොලුගැටයා දැන් යස ඉලන්දාරියෙක්...

## වැඩිය ලස්සනත් නැහැ... ටිකක් ලැජ්ජයි...

# ඒකද මන්දා තාමත් තනිකඩ

පුංචි තිරය වගේම සිනමාව හැඩවැඩ කළ දඟකාර පුංචි කොලුගැටයා දැන් යස ඉලන්දාරියෙක්. 'හඳයා' තුළින් රංගනයට පිවිසි සදෙව් පසුකාලීනව අඳුන්ගිර, හතේ කල්ලිය ආදී ටෙලිනාට්‍ය රැසකටද දායක වෙමින් ප්‍රේක්ෂක ආදරය දිනාගත්තා. අපේ මේ සූදානම සදෙව් වලිමුණි සමග කතාබහක නිරත වන්නටයි.



**කොහොමද සදෙව් සෑහෙන කාලෙකින්?**

ඔව්. මට මතක විදියට 'මව්රට' 'හාට්' එක්ක මේ විදියට මම කතාබහ කළේ 'අඳුන්ගිර' ටෙලිනාට්‍යයේ චුට්ටගේ චරිතය රඟපාන කාලේ. අදටත් මා ළඟ ඒ ආටිකල් එක තියෙනවා. මා ගැන පුවත්පතක පළවුණු මුල්ම ලිපිය තමයි ඒක.

**මාධ්‍ය සමග ගනුදෙනු කරන්න අකැමැතිද?**

මම එහෙම ලොකුවට කතාබහට ගියේ නැහැ. විශේෂයෙන්ම මම සෝෂල් මීඩියා භාවිත කරනවා අඩු නිසා ගොඩ දෙනෙක්ට මාව මගහැරෙන්න ඇති. ඒක මගේ ලොකු වැරැද්දක් කියලා හිතෙනවා. එහෙම වීමට විශේෂම හේතුව මම වැඩි අවධානයක් යොමු කළේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් නිසා. දැන් ඒ සියලු වැඩකටයුතු අවසන්. සමහර විට මම මුල් කාලයේ රඟපාපු ටෙලිනාට්‍යවල මගේ චරිත මතක තිබුණට දැන් රඟපාන ටෙලිනාට්‍යවල මාව දකිනකොට ඒ කාලේ රඟපාපු අහවල් කෙනා කියලා මතකයට එන්නේ නැතුව ඇති. මම දැන් ගොඩක් වෙනස් වෙලා නිසා. දැන් මට වයස අවුරුදු 18ක් වෙනවා.

**ඉතින් මේ දවස්වල රඟපාන ටෙලිනාට්‍ය මොනවද?**

'රොන් සොයා' ටෙලිනාට්‍යයේ හිරුෂ ලෙස රඟපානවා. 'සොනු මන්දාරා' ටෙලිනාට්‍යයේ උමේෂ් ලෙස රඟපානවා. ඉදිරියේදී මම රඟපාපු ටෙලිනාට්‍ය කිහිපයක්ම විකාශය වෙන්න තියෙනවා. ඒ අතර දෙනුවන්, සෙව් ආදරේ සහ හීන කියන සින්දු හරහා ළඟදීම මාව දැකබලා ගන්න පුළුවන්. රොන් සොයා මම රඟපාන හිරුෂ චරිතයට නම් හොඳ ප්‍රතිචාර ගලාගෙන එනවා. සොනු මන්දාරා එක ළඟදි විකාශය වුණු නිසා තවම ලොකු ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ.

**'හීන කියන සින්දු' තුළ කොහොමද වෙනස?**

නාලක විතානගේ තමයි ටෙලිනාට්‍යය අධ්‍යක්ෂණය කරන්නේ. ඉස්ලාම් භක්තික චරිතයක් මම ප්‍රථම වතාවට රඟපාන්නේ. චරිතය හැටියට මම පික්මී දුවන කෙනෙක්. පළමු වතාවට මේ වගේ චරිතයක් රඟපාන නිසා ගොඩක් අවධානයෙන් තමයි රඟපාන්න සිදුවුණේ. ඒ චරිත ස්වභාවය හැටියට භාෂාව, හැසිරීම් රටාව වුණත් ඉතා පරිස්සමෙන් කළේ. මම පොඩි කාලේ ඉඳලා මුස්ලිම් යාළුවෝ ආශ්‍රය කරපු නිසා මට ඔවුන් ඒ භාෂාව කතාබහ කරන රටාව පොඩි හුරුවක් තිබුණා.

> ඉස්ලාම් භක්තික චරිතයක් මම ප්‍රථම වතාවට රඟපාන්නේ.

**ටෙලිනාට්‍ය රඟපාන්න කලින් ඔබව මුලින්ම අපි දැක්කේ සිනමාවෙන්?**

ඔව්. මම මුලින්ම චිත්‍රපටයක රඟපානකොට මට අවුරුදු හයක් විතර ඇති. 'ආකාස පාලම' 'ඇලඩින් සහ පුදුම පහන' චිත්‍රපටවල මම රඟපෑවා. එහි ඇලඩින් හැටියට රඟපෑවේ මම.

**අලුත් චිත්‍රපටයකට ලැබුණු ආරාධනාව ප්‍රතික්ෂේප කළේ ඇයි?**

මට ඒ චිත්‍රපටය ප්‍රතික්ෂේප කරන්න ලැබීම ගැන ගොඩක් කනගාටු වෙනවා. මම ඒ වගේ චරිතයක් රඟපාන්න ගොඩක් ආශාවෙන් හිටියේ. පැවිදි චරිතයකට ආරාධනාවක් ලැබුණු නිසා මට ඒ චරිතය වෙනුවෙන් හිස මඩුකරන්න සිදුවෙනවා. ඒත් මම මේ දිනවල රඟපාන සොනු මන්දාරා චරිතය නිසා මගේ බාහිර ස්වරූපය වෙනස් කරන්න අපහසු වුණා. ඒ නිසා මම ඒ ආරාධනාව ප්‍රතික්ෂේප කළා. රොන් සොයා ටෙලිනාට්‍යයේ චරියත් වෙනස්. මේ නිර්මාණ දෙකම මේ දිනවල විකාශය වෙනවා. චරිතවලට හානියක් කරන්නත් බැහැ. කණ්ඩායම් දෙකම තවත් පැත්තකින් අපහසුතාවට පත්වෙනවනේ එතකොට.

> ඒ චිත්‍රපටය ප්‍රතික්ෂේප කරන්න ලැබීම ගැන ගොඩක් කනගාටු වෙනවා.

**සදෙව්ට දැන් පෙම්වතියක් එහෙම ඇති නේද?**

තවම එහෙම කෙනෙක් නැහැ. මගේ යාළුවන්ට පවා ආදරවන්තියන් ඉන්නවා. මම සමහර විට ලස්සන නැතුව ඇති. මටත් ඒ දේ තවම හිතාගන්න බැහැ. සමහර විට මම නළුවෙක් නිසා ආදරය කරන්න අකැමැති ඇති. ආදරයට මම ටිකක් ලැජ්ජාශීලී කෙනෙක්. ඉතින් මේ සියලු හේතු කාරණා බලනකොට ඒ දේවල් ටිකක් පහුවෙනවා වෙන්නත් පුළුවන්.

වසන්ත විතාරණගේ



## මට තවම හිතාගන්න බැහැ...

---

සහාය අධ්‍යක්ෂවරයෙක් ලෙස කලා ක්ෂේත්‍රයට පා තැබූ ඔහු, අද වනවිට 'සිදු', 'ශක්ති', 'රාජිනී', 'කෝඩුකාරී', 'නෝ පාකින්', 'සිත නිදි නෑ' වැනි ජනප්‍රිය ටෙලිනාට්‍ය රැසකට අධ්‍යක්ෂවරයෙක්. ඔහු නමින් තිළිණ බොරලැස්සයි. ටෙලිනාට්‍යයෙන් ඇරඹි ඔහුගේ ගමනේ නව ආරම්භය ලෙස සිනමාවටත් පියවර තබා තිබෙනවා. ඒ තමයි 'මං හොයන්නේ ප්‍රේමයක්' සිනමා පටය. ඔහුගේ ඒ කුලුඳුල් සිනමා නිර්මාණය තිරගත වීමට තිබෙන මේ මොහොතේ, නිර්මාණයේ තොරතුරු බෙදාහදා ගැනීමට අද 'මව්රට' 'හාට්' අපි ඔහුව කතාබහට එක් කරගත්තා.





**ඔබ සොයන්නෙත් ප්‍රේමයක්ද?**

මම නෙමෙයි ඇත්තටම ප්‍රේමය හොයන්නේ. මම හිතනවා විවාහ අවිවාහක හැම මනුස්සයෙක්ම ප්‍රේමය හොයනවා. අපි ඉන්න බැඳීම් ඇතුළේ සමහර විට හම්බවෙලා ඉන්නේ හරිම කෙනා නොවෙන්න පුළුවන්. ඒ හරිම ප්‍රේමය හොයාගෙන මිනිස්සු ජීවිතේ අන්තිම හුස්ම වෙනකන් යනවා.

**'මං හොයන්නේ ප්‍රේමයක්' ඔබේ කුලුඳුල් චිත්‍රපටය?**

ඔව්, මගේ කුලුඳුල් සිනමා නිර්මාණය 'මං හොයන්නේ ප්‍රේමයක්'.

**චිත්‍රපටයේ තේමාව?**

චිත්‍රපටයේ මුල සිට අවසානය දක්වාම ආදරය විතරමයි තියෙන්නේ. කලින් කිව්වා වගේ ඇත්තටම අපිට හම්බවෙලා තියෙන්නේ හරිම ආදරයද, කොහොමද හරිම ආදරය අපි හොයාගන්නේ, කාන්තාවද පිරිමියාද ආදරය රැකගන්නේ වගේ මාතෘකා වටා තමයි මුළු කතාවම ගලාගෙන යන්නේ.

**නිර්මාණය පසුපස දායකත්වය ගැන මතක් කළොත්?**

නිෂ්පාදනය යූ.එස්.වයි. අජිත් කුමාර, පිටපත අනෝමා

---

රත්නපුරේ ගොඩකවෙලින් පාසල් ගිහින් ටවර්හෝල් එකෙන් රංගනය උගත් ඇය, අද තමන්ගේම සිනමා නිර්මාණයකින් එංගලන්තය දක්වා පාර කපාගෙන ඉවරයි. කෙටි කාලයක් ක්ෂේත්‍රයෙන් ඈත්වෙලා හිටියත් ඇය 'බිඳුණු අහිංසකත්වය' අරන් ආයෙත් ඇවිත්. මේ හර්ෂිගේ රංගන දිවියේ අලුත්ම පිටුවයි.

**හර්ෂි ගැන මුලින්ම සඳහන් කළොත්?**

මම හර්ෂි වික්‍රමසිංහ. මගේ ගම් පළාත රත්නපුර ගොඩකවෙල. මම අධ්‍යාපනය හැදෑරුවේ ගොඩකවෙල රාහුල ජාතික පාසලෙන්.

**එතකොට හර්ෂි කලාවට යොමුවෙන්නේ කොහොමද?**

මම මුලින්ම හිතුවා කලාවට යොමුවෙන්න කලින් ඒ සම්බන්ධව පිළිගත් ආයතනයක හැදෑරීමක් කරන්න. ඒ අනුව මම ටවර්හෝල් පදනමේ අවුරුදු දෙකක පාඨමාලාවක් හැදෑරුවා. එහි නාට්‍ය හා රංග කලාව

විජේවර්ධන, සහාය අධ්‍යක්ෂණය ප්‍රදීප් මානවඩුගේ, සංගීතය තිළිණ තාරක, කලා අධ්‍යක්ෂණය කසුන් සංජය, අංගරචනය බුවනෙක රණවක, කැමරා අධ්‍යක්ෂණය ඇඩම්ස්, සංස්කරණය දිනෙල්ක, නිෂ්පාදන කළමනාකරණය සහන් වර්ණකුලසූරිය වගේ විශාල පිරිසක් මේ නිර්මාණ කර්තව්‍යයට දායකත්වය දෙනවා.

**චිත්‍රපටයේ චරිතවලට රංගනයෙන් එක්වන්නේ කවුද?**

දර්ශන් තවරාජා ප්‍රධාන නළුවා විදිහටත් අභිලාෂි සන්තුෂ්කි ප්‍රධාන නිළිය විදිහටත් කටයුතු කරනවා. ඒ වගේම අනුරාධ මල්ලවආරච්චි, නිල්මිණි තෙන්නකෝන්, අජිත් වීරසිංහ

# මම හොයන්නේ ප්‍රේමයක්...

## ලැබිලා ඉන්නේ හරිම කෙනා නොවෙන්න පුළුවන්...





වැනි ප්‍රවීණයන් හා නවකයන් යන දෙපිරිසම රංගනයෙන් දායක වෙනවා.

**රූගත කිරීම් සිදුවූයේ කොහේද?**

කොළඹ සහ ගාල්ල ප්‍රදේශවලත් විදේශ රූගත කිරීම් තායිලන්තයේත් සිදුකළා.

**චිත්‍රපටය ප්‍රේක්ෂකාගාරයට භාරකරන්න බලාපොරොත්තු වෙන්නේ කවදාද?**

අගෝස්තු අවසානයේ හෝ සැප්තැම්බර් මුල ලංකාවේ ප්‍රේක්ෂකයින්ට බලාගන්න පුළුවන්.

**ඉදිරියේදී ටෙලිනාට්‍යවලට වඩා වැඩි ඉඩක් සිනමාවට වෙන් වෙයිද?**

මගේ වෘත්තිය ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණය. මම ටෙලිනාට්‍ය කරන එක නවත්වන්නේ නැහැ. වර්ෂයකට එක චිත්‍රපටයක් හෝ කිරීමේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා.

**ප්‍රේක්ෂක ඇරයුම?**

'මං හොයන්නේ ප්‍රේමයක්' සිනමා පටය ප්‍රේක්ෂක සිතුම් පැතුම් ගැන හිතලා ඔවුන්ට සාධාරණයක් කරන නිර්මාණයක් වේවි කියලා හිතනවා. මගේ මේ නිර්මාණය නරඹලා ප්‍රේක්ෂක ප්‍රතිචාර හොඳ හෝ නරක ඕනෙ දෙයක් කියන්න. මම ඒ දේවල් ආදරයෙන් පිළිගෙන ඉදිරි නිර්මාණයකදි ඒ වැරදි හදාගෙන ඉදිරියට යන්න තමයි බලාපොරොත්තුව. ඔයාලා ලාංකීය සිනමාව වෙනුවෙන් සිනමාපටයක් බලන එක තමයි අපිට තියෙන ලොකුම දායකත්වය. අපේ වර්තමාන වැඩිහිටි පිරිස ආදරය දැනට වඩා සුන්දරව විඳපු අය. චිත්‍රපටය නරඹද්දි ඒ දවස්වල ඔවුන් විඳපු ඒ ආදරය සුන්දර අතීතාවර්ජනයක් වෙයි කියලා හිතනවා. ප්‍රේක්ෂකයන් ඉතාම ආදරයෙන් වැලඳ ගන්න ආදරණීය කතාවක් වේවි කියලා හිතනවා.

**තිළිණ, ඔබේ සිනමාවේ දැක්ම මොකක්ද?**

ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයෙක් විදිහට මිනිස්සුන්ව සතුටින් තියන්න ඕනෙ කියන තේමාව ඇතුළේ තමයි මම ඉන්නේ. 'මං හොයන්නේ ප්‍රේමයක්' චිත්‍රපටය උදාහරණයක් විදිහට ගත්තොත් ෆිල්ම් එක බලලා සතුටින් සිනමා ශාලාවෙන් පිටව යයි කියන විශ්වාසය මගේ හිතේ තියෙනවා.

**ඉදිරි නිර්මාණ කටයුතු?**

රවීන් කනිෂ්ක සහ නෙත්මි රොෂෙල් ප්‍රධාන රංගනයෙන් එක් වන අලුත් ටෙලි නිර්මාණයක් එන්න තියෙනවා දෙරණ නාලිකාවේ. 'හත්වැනි මනාලි' කියලා නාට්‍යයක්.

**පවුලේ විස්තර?**

දුවලා තුන් දෙනයි, පුතයි, බිරිඳයි එක්ක සාමාන්‍ය විදිහට ජීවිතේ ගෙවෙනවා.

**විශේෂයෙන් ස්තුති කළ යුතු පිරිසක් ඔබට ඇති?**

මගේ මව ආදරයෙන් මතක් කරන්න ඕනෙ. ඇය මගේ හැම නිර්මාණයක්ම බලලා සතුටු වෙනවා. ඇයගේ ආශීර්වාදයත් මට තියෙනවා. මාව ක්ෂේත්‍රයට ගෙනාපු දේවින්ද කෝංගහගේ අයියා, දෙරණ නාලිකාවේ සභාපතිතුමා, නියෝජ්‍ය සභාපති ලක්සිරි වික්‍රමගේ මහතා, මාධව මඩවල මහතා, ශර්මිලා ධර්මරාසා මහත්මිය, ඒ වගේම මගේ ගමනට මහගු රුකුලක් වූ මගේ නිෂ්පාදක ජානක සිරිවර්ධන මහත්මයා ඇතුළු සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

> කොළඹ සහ ගාල්ල ප්‍රදේශවලත් විදේශ රූගත කිරීම් තායිලන්තයේත් සිදුකළා.

**ලංකාවේ විතරක් නෙවෙයි මේ ආදරේ හොයන් තායිලන්තයටත් ගියා...**

ස්ටෙෆනි කොතලාවල

---

## වේදිකාවේ රඟපාලා ඊජිප්තුවත් හොල්ලලා

# සිනමාව අල්ලපු හර්ෂි...

### හර්ෂි වික්‍රමසිංහ



හැදෑරීමෙන් පසු මම මුලින්ම වේදිකා නාට්‍ය රංගනයට එකතු වුණා. ඊට අමතරව රංග වස්ත්‍රාභරණ පැත්තෙනුත් මම සම්බන්ධ වුණා.

**හර්ෂිගේ මුල්ම වේදිකා ගමන මතක් කළොත්?**

දමයන්ති ෆොන්සේකා අධ්‍යක්ෂණය කළ 'අපේ ඇත්තෝ' වේදිකා නාට්‍යයේ ප්‍රධාන චරිතයක් රඟපෑමට අවස්ථාව ලැබුණා. මම එහි රඟපෑවේ මීමැසි රැජිනගේ චරිතය. 'බෝංචි ගෙදර' වේදිකා නාට්‍යයේ ඩැනීගේ චරිතයත් මම රඟපෑවා. චාමික හත්ලාවත්තගේ 'හරි අපූරු දවසක්' වේදිකා නාට්‍යයෙත් මම රඟපෑවා.

**'හරි අපූරු දවසක්' ඔබට විශේෂ දවසක් වුණා කියලා මම සඳහන් කළොත්?**

මගේ රංගන ජීවිතයේ සුවිශේෂතම දවස තමයි 'හරි අපූරු දවසක්' වේදිකා නාට්‍යය. ඒ වෙනුවෙන් විදේශගත වීමට පවා මට අවස්ථාව ලැබුණා. රාජ්‍ය නාට්‍ය උළෙලේදී 'හරි අපූරු දවසක්' නාට්‍යයට සම්මාන රැසක් හිමිවුණා. පසුකාලීනව තමයි අපේ කණ්ඩායම ඊජිප්තුවට ගියේ. ඒ ගියෙත් සම්මාන උළෙලකට. ඒ තරගය වෙනුවෙන් ඉදිරිපත් කරපු රටවල් ගණනාවක නාට්‍ය අපිට දැකබලා ගන්න පුළුවන් වුණා.

**තවම ටෙලිනාට්‍ය රංගනයට අවස්ථාවක් ලැබුණේ නැද්ද?**

තවම පුංචි තිරයට ආරාධනාවක් ආවේ නැහැ. හැබැයි මට 'මචං' චිත්‍රපටයේ සහාය කලා ශිල්පිනියක් විදියට වැඩකරන්න අවස්ථාව ලැබුණා. තිරයෙන් පිටුපස ඉඳගෙන මම ගොඩක් දේවල් ඒ සම්බන්ධව ඉගෙන ගත්තා. රංගනය පැත්තෙන් මට ගොඩක් දේවල් මගහැරුණා.

> තවම පුංචි තිරයට ආරාධනාවක් ආවේ නැහැ.

**එහෙම වීමට හේතුව කියන්න පුළුවන්ද?**

මම අවුරුදු පහක් විතර ක්ෂේත්‍රයෙන් ඈත්වෙලා හිටියා. ඒක තමයි ප්‍රධානම හේතුව. පසුකාලීනව මම රත්නපුර ජාත්‍යන්තර පාසලක ගුරුවරියක් ලෙස කටයුතු කළා. ඒ ඉන්න ගමන් මම පිටපත් කිහිපයක් රචනා කළා දවසක මගේම කියලා නිර්මාණයක් කරනවා කියන අදහසින්.

**'බිඳුණු අහිංසකත්වය' නිර්මාණය ගැන කතා කරමු?**

මගේ කුළුඳුල් කෙටි චිත්‍රපටය තමයි මේක. මෙය පාදක වෙන්නේ සත්‍ය කතාවක් ඇසුරෙන්. අනුරංග වික්‍රමසිංහ මගේ දක්ෂතාව හඳුනාගෙන අපි එකතු වෙලා නිර්මාණයක් කරමු කියලා කතාබහ කළා. ඔහුගේ මගපෙන්වීම යටතේ තමයි මේ නිර්මාණය බිහිවුණේ. මම ඊට රංගනයෙන් දායක වෙනවා. අනුරංග වික්‍රමසිංහ, හේමන්ත කෝරාළගේ ප්‍රධාන චරිත රඟපානවා. හිතුව තරම් ලේසි වුණේ නැහැ. හැබැයි මගේ පිටුපස ඉඳගෙන මාව ගොඩ දෙනෙක් දිරිමත් කළා. දමයන්ති ෆොන්සේකා පවා මට කිව්වේ හරියන්න හරි වරදින්න හරි කරපන් කියලා.

**කොයි කාලවකවානුවේද මේ නිර්මාණය දැකබලා ගන්න පුළුවන්?**

මගේ යාළුවෙක් කතා කරලා කිව්වා එංගලන්තේ ෆිල්ම් ෆෙස්ටිවල් එකකට දාන්න හර්ෂි නිර්මාණයක් තියෙනවා නම් එවන්න කියලා. ඒ අදහසට තමයි මම මේ කෙටි චිත්‍රපටය නිර්මාණය කළේ. පුවත්පත් කලාවේදීන්ගේ මණ්ඩලයේ ජූලි 30 දින සවස 4.00ට මෙය ප්‍රදර්ශනය කරනවා.

**මේක ඇත්ත කතාවක්...**

**ගොඩක් දේවල් මගහැරුණා...**

වසන්ත විතාරණගේ

# ලව් සීන්වලින් කළු සීන්වලට බැහැපු විශ්ව පෙරළිය...

## විශ්ව කොඩිකාර

**පසුගියදාක නිමාවට පත්වුණු ජාතික රූපවාහිනියේ විකාශය වූ 'වරකත' ටෙලි ඩ්‍රාමා එකෙන් පස්සේ විශ්ව කොඩිකාර ගැන හැමෝම වගේ වෙනදාට වැඩිය විශේෂයෙන් කතාකරන්න ගත්තාය කිව්වොත් ඒක බොරුවක් එහෙම නෙවෙයි. සමාජ මාධ්‍යවල වගේම මුහුණු පොතෙත් විශ්ව කරපු වරකත චරිතයට හෘදයාංගම මව ලොකු ප්‍රශංසාවක් හිමිවෙලා තිබුණා.**

**ඒ කියන්නේ විශ්ව කොඩිකාර ආයෙමත් කරළියට ඇවිදින් කියලද?**

ආයෙමත් එන්න දෙයක් නැහැ. නළුවෙක් වෙච්ච දා ඉඳන්ම විශ්ව හිටියේ කරළියෙම තමයි. හැමදාමත් වගේ ඔහුට වැඩ තිබුණා. ඒ වගේම ඔහු රංගනයට සේන්දු වෙලා මේ වනවිට දශක දෙකකට ආසන්නයි. නළුවෙක් හැටියට විශ්ව සාර්ථකයි. වංහුං ටිකක් කතා කරන්න හිතාගෙන ඔහුට කෝල් එකක් දුන්නත් හැමදාමත් බොහොම සුහදව හෙලෝ කියන කලාකරුවන් අතර ඔහු පළමුවැනියට ඉන්නවා.

**කොහොමද විශ්ව ඉතින් ජීවිතේ?**

ජීවිතේ නම් බොහොම සුන්දරව ගලාගෙන යනවා කිව්වොත් කිසි වරදක් නැහැ. මගේ දරු පවුල සමග රංගන කටයුතු සමග සතුටින් ඉදිරියට යනවා.

**වරකත ටෙලිය පසුගියදාක අවසන් වුණා?**

බොහොම ආසාවෙන් දායක වෙච්ච සුපිරි වැඩක්. හරිම හැඟීම්බර රංගනයක යෙදුණු කතා පුවතක්.

**මුහුණු පොත පුරා ප්‍රතිචාර එකසිය ගානට වයිරල් වෙනවා?**

කියලා වැඩක් නැහැ. කිව්වා වගේම හැමෝම අතිවිශිෂ්ටයි විශ්ව කියන ප්‍රතිචාරය ලෝභ නැතුව දීලා තිබුණා.

**ඉවරයක් වුණත් වරකත ගැන කවුරුත් කතා කරන නිසා අපිත් ටිකක් වරකත ගැන කතාකරමු විශ්ව?**

අනිවාර්යයෙන්ම කතර කරන්නම ඕනේ නිර්මාණයක් ඒක. මගේ ගජයා මිහිර සිරිතිලක තමයි මට වරකතට ආරාධනා කළේ. හැමෝම හිතුවේ අපි දෙන්නා අතර තියෙන යාළුකම නිසා මට 'වරකත' චරිතය ලැබුණා කියලා. ඒත් ඒක නෙවෙයි ඇත්ත කතාව. මිහිර සිරිතිලක වරකත නිර්මාණය වෙනුවෙන් පැන අතට ගත්තේ මාව ඔළුවේ තියාගෙ නමයි. ඒ යාළුකමට නෙවෙයි. ඒ චරිතෙට මාවම හරියන නිසයි. ඒයි විශ්වයා, වැඩේට ලැස්ති වෙයන්. උඹම තමයි මේකට හරියන කෙනා. හිතට අරන් වැඩේට බැහැපන් මල්ලියේ කියලා ඔහු හරිම හෘදයාංග මව පිටට ආදරණීය තට්ටුවක් දාලා කිව්වා.

**ඒ කිව්ව විදියටම ඔබ චරිතෙට බැස්සද විශ්ව?**

මොනවා කියනවද? බොක්කෙන්ම වැඩේට බැස්සා. එකක් යාළුකම. අනෙක මම ඒ චරිතය ගැන තිබුණු පැහැදීම. ඒක වෙනස්ම ආට් එකකට නිර්මාණය වුණු ටෙලි කතාවක්. මටත් ඕනෙකම තිබුණා පෙම්වතා සහ වීරයාගේ චරිතයෙන් සමුග න්න. මගේ ගුරුවරයා මහේන්ද්‍ර පෙරේරා මහත්තයත් මට නිතර කියපු දෙයක් තිබුණා. 'විශ්ව එකම චරිතයකට කොටුවෙන්න එපා... වෙනස් වෙන්න ඕනෙ තැනදී වෙනස් වෙයන්, නැත්නම් මිනිස්සුන්ට නෙවෙයි අපිටත් අපිව වෙනස් වෙන්න ගන්නවා' කියලා. ඒ විතරක් නෙවෙයි, බිමල් අයියා, පබෝධා අක්කා, සාරංග අයියා පවා මට ඒ ටික කිව්වා. 'සුදු චරිත නෙවෙයි කළු චරිතත් භාරගනින්. ප්‍රේක්ෂකයෝ කළු චරිතවලට වෛර කළාට ඒ චරිතෙ කරපු නළුවට ලකුණු දෙනවා' කියලා. ඉතින් ඒ අවවාද සහ ගුරුහරුකම් එක්ක මම වරකත නාට්‍යයට මට හැකි උපරිම සාධාරණය කළා.

**ඔබේ මිත්‍රයා මිහිර සිරිතිලක ඒ ගැන සෑහීමකට පත්වුණාද?**

ඔව්. ඔහු මට කිව්වා සතුටුයි මචං, මාරම සතුටුයි කියලා. ඔහුව ඒ විදියට සතුටු කරන්න වරකත නාට්‍ය කණ්ඩායමෙන් මට ලැබුණු සහාය ගැනත් කියන්නම ඕනේ. ප්‍රවීණයන් විතරක් නෙවෙයි අපේ අලුත් නිළිය ඉමා වීරසූරිය, සහාය නිළිය ලෙස ඇ මට දුන්න අත්වැල, සහයෝගය ගැන කියන්න වචන නැති තරම්. මහේන්ද්‍ර පෙරේරා මහත්තයා මට නිතර කියන කතාවල එක් සුවිශේෂ කතාවක් තිබුණා. ඒ, යම් නිර්මාණයකදී ප්‍රධාන නාළුවාට ලැබිය යුතුව තියෙන ප්‍රධාන නිළියගේ සපෝට් එක ගැන. ඔහු කිව්වා සහාය නිළිය කියන්නේ ප්‍රධාන චරිතය රඟපාන නළුවාට හොඳ සාර්ථකත්වයක් දෙන අත්වැලක් කියලා. ඒ අත්වැල ලැබෙනවා කියන්නේ ප්‍රධාන නළුවට ලොකු ගැම්මක් කියලා ඔහු කිව්වා. ඔහු ඒ කියලු කතාවට මට දෙන්න පුළුවන් ළඟම නිදසුනක් විදියට 'වරකත' ටෙලියේ ඉමා වීරසූරියව දෙන්න පුළුවන්.

**කාන්තා පාර්ශ්වය වරකත අවසානයේදී ඇස්වල කඳුළු පුරවාගත්තේ ඉතා හැඟීම්බරවලු?**

ඇත්තෙන්ම ලැබුණු ප්‍රතිචාරවල ඒ කාරණයද නොඅඩුව තිබුණා. 'ලස්සන කතාවක්, දුක හිතෙන අවසානයක්... අනේ මගේ පපුවත් හිරවුණා... හොඳටම ඇඬුණා..' බොහොමයක් තරුණ ගැහැනු ළමයි වගේම වැඩිහිටි කාන්තාවන්ද එහෙම කමෙන්ට් කරලා තිබුණා.

**විශ්ව ඔබ කතාකරන්නේ ලොකු ආත්ම තෘප්තියකින්?**

සත්තකින්ම ඔබේ ඒ අදහස හරියටම හරි. වරකත තිරපිටපත ලැබුණු දා පටන්ම එහි අවසානය දක්වාත්, ප්‍රතිචාර ලැබෙමින් තියෙන මේ කාලය තුළත් මා අත්විඳි ආත්ම තෘප්තිය අසීමිතයි.

**ඒ සතුට අතරතුර ටිකක් නරක ආරංචියකුත් අහන්න ලැබුණා විශ්ව?**

ඒ මොකක්ද? මා ගැන මම නොදන්න නරක ආරංචිය?

**ඔබේ බිරිඳ එරන්දි 'වරකත' ටෙලිය නිසා ඔබ සමග අමනාපෙන් ඉන්නවලු?**

අප්පච්චියේ... ඒකත් හොයාගත්තද? ඔයාලා නම් මාරම පැපරාසියෝ. හිතුවේ නැහැ ලීක් වෙයි කියලා ඒ කේස් එක.

**දැන් ලීක් වුණානේ. කියන්නකෝ මොකක්ද ඒ සංගදිය කියලා?**

'වරකත' ටෙලියේ සමහර රූගතකිරීම් ඉවර වුණු දවසට සිරිතිලක අයියා මගේ ළඟට ඇවිදින් අහනවා 'විශ්ව මචං මේ දවස්වල එරන්දි රට නේද?' කියලා. මමත් හිනාවෙලා 'මේ දවස්වල නම් රට තමයි... හැබැයි ළඟදි එනවා' කියලා කියනවා. එතකොට ඔහු නළලට අත ගහලා 'මළ කෙළියයි ජූලි හතයි' කියලා කිව්වා. සිරිතිලක අයියා එරන්දිව හොඳට හඳුනනවා. ඒ වගේම මම ලව් සීන් රඟපානකොට එරන්දිට ඒවා දිරවන්නේ නැති බවත් දන්නවා. ඒත් ඉතින් කතාවේ හැටියට වරකත ටෙලියට ලව් සීන් නොදාම බැරි නිසා ඒ වගේ සීන් හිටු කියලා දැම්මා.

ඔන්න ඉතින් එරන්දි රට ඉඳන් ආවා කියන්නකෝ. දවසක් ෂූටින් ඉවර වෙලා ගෙදර



**හැමෝම හිතුවේ අපි දෙන්නා අතර තියෙන යාළුකම නිසා මට 'වරකත' චරිතය ලැබුණා කියලා.**

**'ලස්සන කතාවක්, දුක හිතෙනඅවසානයක්... අනේ මගේ පපුවත් හිරවුණා... හොඳටම ඇඬුණා..'**

**කේස් එක ලීක් වෙයි කියලා හිතුවේ නැහැ...**

**ලව් සීන් රඟපාද්දි වයිෆ්ට දිරවන්නේ නැහැ**



ඇවිදින් මම ඇහුවා අලුත් ටෙලිය බලන්න ගත්තද කියලා. 'තාම නැහැ බලන්න ගන්න බෑ' කිව්වා. කොටස් දෙකයි බැලුවේ, නහුතෙට තදවෙලා හිටියා. මමත් ටිකක් අවුස්සන්න ඕනේ හින්දම 'ටෙලිය හොඳද? මොනවද අඩුපාඩු සුදූ...' කියලා ඇහුවා. 'අඩුපාඩු නම් නැහැ. ඕනෑවටත් වඩා දේවල් ඒකේ තියෙන එකයි ප්‍රශ්නේ..' කියලා කිව්වා කියහංකො මෙයා. ඉන් පස්සේ ටිකක් රවලා ගොරවලා 'මොනවද ඒ සීන්... ඕවා ඒ හැටිම ඕනෙද... ආයේ නම් බලන්නේ නැහැ මම ඔය මඟුල..' කියලා මටත් ගස්සගෙන ගියා.

**තාම එරන්දි ඉන්නේ විරසකෙන්ද විශ්ව?**

දැන් නම් ෂේප්. හැබැයි වරකත නම් මළාට බැලුවේ නැහැ. මටවත් ගෙදරදි ඒක බලන්න දුන්නේ නැහැ. වරකත අවසානයි කියලා දැනගත්තම 'යන්තම් ඇති ඒ විකාරේ ඉවරයක් වුණා' කියලා කිව්වා.

**දබර කරන්නේ වැඩි සෙනෙහසට කියනවනේ නේද විශ්ව?**

අන්න කතාව. ඒක තමයි ඇත්ත. අපි හරිම ආදරණීය බැඳීමක් තියෙන පවුලක්. ඒ හින්දා තමයි සීරියස් ලව් සීන්වලට එරන්දිට තරහා එන්නේ. ඕවා ඉතින් පවුල් ජීවිතේ තුළ සාමාන්‍ය පලහිලව් තමයි.

**කතාව නම් හරිම රසවත්. විශ්ව කියමු ඉතින් අවසානෙට යමක්?**

නිෂ්පාදනය සහ අධ්‍යක්ෂණය ගැන ටෙලි සිහිනයක් දකිමින් ඉන්නවා. ඒ හීනේ හැබෑ කරගන්න තව දුර මම යායුතුයි කියා හිතනවා. නිසි කලට ඒ සඳහා අවැසි පියවර තබනවාය කියන කාරණය ගැන තමයි අලුත් යමක් කියලා කියන්න තියෙන්නේ.

**මල්මි කෞෂල්‍යා**



අතිවිශේෂයි

තව දුර තියෙනවා...

කැපිලි කෙටිලි අස්සේ

# බඹරෙක් ඇවිත් විනූට දුන්න සම්මානේ...





විනූ පෙරේරා

ටෙලිනාට්‍ය රැසක චරිත ජීවමාන කරමින් ප්‍රේක්ෂක ආදරය දිනාගත් විනූ කාලයක් නිර්මාණ තුළින් අපට දැකගන්න ලැබුණේ නැහැ. ඒත් ඒ නිහඬ බව බිඳිමින් ඇය ගැන බොහෝ දෙනෙක් කතාබහ කරන්න පටන් ගත්තා. ඒ විතරක් නෙවෙයි ලෝකවාසී ප්‍රේක්ෂක ජනතාවගෙන් ඇයට සුබපැතුම් ගලාගෙන ආවා. ඒ වෙන කිසිම දේකට නෙවෙයි, පසුගියදා පැවැති සුමති සම්මාන උළෙලේදී ඇය නැගී එන නිළිය ලෙස සම්මානයට පාත්‍ර වීම නිසයි. ඉතින් වැඩි සද්දයක් නැතිව හිටිය විනූ පෙරේරා සමග ඒ ගැන මේ විදියට කතාබහ කරන්න අපි හිතුවා.

හිතුණේ මගේ හීනය ඉවරයි කියලා

**විනූ බඹරේ වැල්ලෙත් කැරකුණා එහෙනම්?**

හොඳටම කැරකුණා. මේ දවස්වල ඒ වෙනුවෙන් සුබපැතුම් ගලාගෙන එන කාලවකවානුවක්. මමත් ගොඩක් සතුටින් මගේ ආදරණීය ප්‍රේක්ෂක ජනතාවගේ සුබපැතුම් භාරගන්නවා.

**මේ ලැබුණු සම්මානය ගැන මොකද හිතෙන්නේ?**

ඒ ගැන නම් කියන්න වචන නැති තරම්. නොසිතූ නිමේෂයක ලැබුණු සම්මානයක්. මගේ චූටි පුතා මට වාසනාව අරගෙන ආවා. මේ ලැබුණු සම්මානය මට දෙවැනි දරුවෙක් හා සමානයි. ඒ තරම් වටිනා





ඇගයීමක්. නැගී එන නිළියට මාව නිර්දේශ වෙලා කියලා දැනගත්ත එකම මට ලොකු සතුටක්. සුමති සම්මාන උළෙල කියන්නේ ලංකාවේ තියෙන සම්මාන උළෙල අතරින් ප්‍රධානම සම්මාන උළෙලක්. ඉතින් මට ඒ වෙලාවේ හිතුණේ මේ වගේ සම්මාන උළෙලකට නිර්දේශ වීමත් ඇති කියලා මට ඉදිරියේදී වැඩ කරගන්න. මම මේ ක්ෂේත්‍රයේ අවුරුදු 5ක් විතර වැඩ කළා. ඒ මහන්සියේ ප්‍රතිඵලයක් තමයි මේ.

**මේ ලබපු අගැයීමත් සමග ඔබ නැවත ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනවද?**

මට දැන් පුතෙක් ඉන්නවා. මාස 8යි දැන් එයාට. පුතා ලැබෙන කාලයත් සමග මම ක්ෂේත්‍රයෙන් ටික කාලයක් ඈත්වෙලා හිටියේ. මම හිතුවා මගේ හීනය ඉවරයි කියලා. මේ ක්ෂේත්‍රය ගැන මම කලකිරීමකින් හිටියේ. මොකද අඩු තරමින් මම ළඟින් ආශ්‍රය කරපු කෙනෙක්වත් මම ගැන ඇහුවේ නැහැ. මේ ගෙවුණු කාලය තුළ මම ගොඩක් දේවල් තේරුම් අරගෙන පවුලේ අය සමග සතුටින් කාලය ගතකළා. හැබැයි කලා ජීවිතය ගැන හිතනකොට මම දුක්බරව තමයි හිටියේ. දැන් ඉතින් ඉදිරියේදී නිර්මාණවලට ආරාධනා ආවොත් සම්බන්ධ වෙනවා.

**මල්කාන්ති චරිතය මේ තරම් අගැයීමට ලක්වෙන්න හේතුව ඔබට දැනුණේ කොහොමද?**

'බඹරෙක් ඇවිත්' ටෙලිනාට්‍යය මගේ රංගන ජීවිතය වෙනස් කරපු නිර්මාණයක්. කාලයක් රඟපෑවේ පෙම්වතියගේ චරිත. මේ චරිතය 1960 ගණන්වල චරිතයක් නිසා මට ඒ ගැන ගොඩක් හොයලා බලන්න සිදුවුණා. චරිත් අබේසිංහ තමයි 'බඹරෙක් ඇවිත්' ටෙලිනාට්‍යය අධ්‍යක්ෂණය කරන්නේ. මට කතා කරන්නේ චරිත් අයියා 'සංසාරි' ටෙලිනාට්‍යයේ මම රඟපානවා දැකලා. මම චරිතෙට වඩා බය වුණේ චරිත් අයියා සමග වැඩ කරන්න. මම කැමතිම රංගන ශිල්පියෙක් චරිත් අයියා. බඹරෙක් ඇවිත් ටෙලිනාට්‍යයට දැවැන්ත පිරිසක් සම්බන්ධ වෙන නිසා මම බය වුණා. මම අයියගෙන් ඇහුවේ එකම දෙයයි. මට මේ චරිතය කරන්න පුළුවන් වෙයිද කියලා විතරයි මම ඇහුවේ.

**මේ වගේ චරිත රඟපානකොට වටින් පිටින් චරිත කපන්න උත්සාහ කරන සිදුවීම් තියෙනවා?**

ඔව්. චරිත් අයිට කියලා තිබුණා අපි වගේ අලුත් අය ගත්තොත් වැඩේ කරගෙන යන්න අමාරු වෙයි කියලා. ඒත් චරිත් අයියා මාව විශ්වාස කරලා මල්කාන්ති චරිතයට තෝරාගත්තා.

**මේ කාලවකවානුවේ විනූට ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්නත් සිදුවුණා?**

'බඹරෙක් ඇවිත්' ටෙලිනාට්‍යයේ රූගත කිරීම් පළමු ෂෙඩියුල් එක අවසන් කරලා ගෙදර ඉන්න කාලවකවානුවේ මගේ තාත්තා රිය අනතුරකට ලක්වෙලා නැතිවෙනවා. ඊට දින කිහිපයකට පස්සේ මමත් රිය අනතුරකින් තුවාල වෙලා ගෙදර හිටියේ. ඔය වගේ ප්‍රශ්න ගොඩකට මුහුණ දීලා මම මානසිකව වැටිලා හිටියේ.

**වසන්ත විතාරණගේ**

# හුණු දූවිලි සුවඳයි 'ස' යන්නේ වාසනාවයි එක්ක

# නුරානි දැන් හරි සංවරයි...

## මට හිතුණු හිතුණු චරිත රඟපාන්න බැහැ...



**පාසල් කාමරයේ හුණු දූවිලි සුවඳ මැද පොඩිත්තන්ට අකුරු කරන ඇය, ටෙලි තිරයේදී අපට හමුවන්නේ සැබෑ රංගන ප්‍රතිභාවෙන් පිරිපුන් ශිල්පිනියක ලෙසිනි. 'සකර්ම', 'සසංකාරා' වැනි දැවැන්ත නිර්මාණ හරහා ප්‍රේක්ෂක හදවත් තදින්ම වැලඳගත් ඇය, මේ දිනවල නැවතත් අප හමුවට එන්නට සූදානම් වන්නේ 'සංවරය' ටෙලිනාට්‍යයේ 'මේනකා' ලෙසිනි. ගුරු වෘත්තියේ ගරුත්වය රැකගෙන කලා ලොවේ අපූරු ගමනක් යන නුරානි තෙන්නකෝන් සමග දොඩමලු වන්නටයි 'හාට්' අපේ මේ සූදානම.**

**කොහොමද නුරානි මේ දවස්වල පාසලේ වැඩකටයුතු?**

හොඳින් කරගෙන යනවා. කුලියාපිටිය හොරතැපොල මහානාම මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ ගුරුවරියක් ලෙස තමයි මම සේවය කරන්නේ.

**මේ දිනවල තවත් අලුත් චරිතයක් හරහා ඔබ නැවත අපට හමුවෙනවා?**

ප්‍රියන්ත ප්‍රනාන්දු අධ්‍යක්ෂණය කරන 'සංවරය' ටෙලිනාට්‍යයේ මේනකා චරිතය මම රඟපානවා. 'සංවරය' ටෙලිනාට්‍යයේ රූගත කිරීම් සඳහා ඉදිරියේදී සම්බන්ධ වෙනවා.

**ඉතින් කියමුකො බලන්න ඔබේ අලුත්ම රංගන චාරිකාව ගැන?**

මේනකා කියන්නේ පෙම්වතියකගේ චරිතයක්. ප්‍රියන්ත අයියාගේ නිර්මාණ දෙකකට මම මීට පෙර සම්බන්ධ වුණා. ඒ චරිත දෙකට වඩා වෙනස්ම තවත් ආදරණීය චරිතයක් තමයි මේනකා කියන්නේ.

**එකම අධ්‍යක්ෂවරයකුගේ නිර්මාණ කිහිපයකම ඔබ සම්බන්ධ වීමේ විශේෂ හේතුවක් තියෙනවද?**

පසුගිය දවස්වල මට එක දිගට ආපු චෝදනාවක් තමයි මම සම්බන්ධ වෙන්නේ ප්‍රියන්ත ප්‍රනාන්දුගේ නිර්මාණවලට විතරයි කියලා. එහෙම විශේෂත්වයක් නැහැ. ඇත්තටම සසංකාරා ටෙලිනාට්‍යයෙන් පස්සේ විකාශය වුණා ප්‍රියන්ත අයියගේ තවත් නිර්මාණයක් 'සුසුම් රස්තියාදුව'. ඒකට මම සම්බන්ධ වුණේ නැහැ. ටෙලිනාට්‍යවල පිටපත කියවනකොට හිතේ මැවෙනවා මේ චරිතයට අහවල් කෙනා ගැළපෙනවා කියලා. එහෙම හිතලා තමයි ප්‍රියන්ත අයියා ඔහුගේ නිර්මාණ සඳහා තෝරාගන්නේ. ප්‍රියන්ත අයියාගේ හැම නිර්මාණයකම මම රඟපෑවා කියලා හිතවත්කම මත ඔහු මාව චරිතවලට තෝරාගන්නේ නැහැ.

**'සකර්ම' ටෙලිනාට්‍යය කරන කාලේ නුරානි ඇඬුවේ ඇයි?**

මම ප්‍රියන්ත අයියාගේ වැඩ කරපු පළමු නිර්මාණය 'සකර්ම'. මම ඔහුගේ නිර්මාණයට ආධුනික රංගන ශිල්පිනියක්. ප්‍රියන්ත අයියා වැඩේදි සැරයි. එක එක අධ්‍යක්ෂවරුන්ගේ ස්ටයිල්ස් තියෙනවා. ප්‍රියන්ත අයියාගේ ස්ටයිල් එකට හුරුවෙන්න ටික කාලයක් යනවා. ඉතින් සමහර අවස්ථාවල ප්‍රියන්ත අයියා බණිනවා. ප්‍රියන්ත අයියාට කෙනා අදාළ නැහැ. ඒ අවස්ථාවල ඉතින් මම අඬනවා. අයියට ඕනෙ විදියට රූපරාමුව ගලාගෙන ගියේ නැත්නම් එයාට ටිකක් කේන්ති යනවා. ප්‍රියන්ත අයියගේ නිර්මාණවලට පිටපතේ තියෙන දෙබස් ඒ විදියටම ඕනෙ. අපිට කියන්න අපහසුයි කියලා වෙනස් කරන්න බැහැ. ප්‍රියන්ත අයියා චරිතය ගැන අපිට හොඳ අවබෝධයක් දෙනවා. ඔහු සමග චරිතය කතාබහ කරනකොට ඒ වගේම නිදහස දෙනවා චරිතය කරගෙන යන්න. අපිට පහසු විදියට චරිතය හැඩගස්වන්න ඉඩ දෙනවා. චරිතයේදී ආධුනික වෙන්න එපා කියලා උපදෙස් දෙනවා. ඔහු දෙන ගුරුහරුකම් අපේ රංගන ජීවිතයට ලොකු මෙවලමක්. මමත් සමහර තැන් නොතේරෙන දේවල් අයියගෙන් අහනවා. ඒ වෙලාවට කිසිම ලෝභකමක් නැතිව හැම දේම හොඳට පැහැදිලි කරලා කියලා දෙනවා. ප්‍රියන්ත අයියගේ ස්ටයිල් එක හරියටම තේරුම් ගත්තොත් ඉතින් ලොකු පහසුවක් තියෙනවා. මම ප්‍රැක්ටිකල් පැත්තෙන් අයියගේ නිර්මාණවලදි ගොඩක් දේවල් ඉගෙන ගත්තා.

**'ස' යන්න ඔබේ රංගනයට වාසනාව ගෙනාවා?**

මමත් ප්‍රියන්ත අයියගෙන් ඇහුවා ඇයි 'ස' යන්න මුලට ගෙන නිර්මාණවලට නම දාන්නේ කියලා. මට හේතුවක් කිව්වෙත් නැහැ. හැබැයි ඔහුගේ සියලු නිර්මාණ සම්මාන පිට සම්මාන ගත්ත හොඳ ටෙලි නිර්මාණ. ඒ වගේම ප්‍රේක්ෂකයන් ආදරයෙන් වැලඳ ගත්ත ටෙලිනාට්‍ය. 'ස' යන්න අයියට සුබදායක අකුරක් වෙන්න ඇති. අපිටත් සුබයි. ඉතින් 2017 මම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නේ. මම විවිධ නිර්මාණවල වැඩ කළා. 'සසංකාරා' ටෙලිනාට්‍යයේ මම රඟපාපු චරිතයෙන් එළියට බහින්න බැරි තත්ත්වයක් උදාවුණා. ප්‍රේක්ෂකයන් මම දිහා බැලුවේ මම මොනවා හරි වැරැද්දක් කළා වගේ හැඟීමකින්. ප්‍රේක්ෂකයන් අතරට මටත් යන්න ලැබුණේ ඒ නිර්මාණ හරහා තමයි. ගොඩක් නිර්මාණ සඳහා මට ආරාධනා ආවෙත් 'සසංකාරා' විකාශය වුණාට පස්සේ.

**නුරානිගේ ගුරු වෘත්තියේ වැඩකටයුතුත් සමග කොහොමද රංගන කටයුතු කරගෙන යන්නේ?**

මගේ ගුරු වෘත්තියේ වැඩකටයුතු සමග ගැටලුවක් නැතුවාමත් නෙවෙයි. මම මගේ ගුරු වෘත්තියේ තවම ඉන්නේ පරිවාස කාලේ. තවම අවුරුදු 3ක්වත් ඉවර නැහැ. මම උගන්වන්නේ ප්‍රයිමරි පන්තිවලට. එතකොට මම නිවාඩු ගත්තා කියන්නේ අර පොඩි ළමයින්ට මුළු දවසම නැති වෙනවා. මම සේවය කරන පාසල මගේ කලා කටයුතුවලට ලොකු සම්පතක්. මගේ රංගන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ඕනෑම වෙලාවක මාව නිදහස් කරනවා. මම වෙනුවෙන් අනෙකුත් ගුරුවරු කැපවෙලා මට ලොකු සහායක් ලබාදෙනවා මගේ වැඩකටයුතු කරගෙන යන්න.

> **මගේ ගුරු වෘත්තියේ වැඩකටයුතු සමග ගැටලුවක් නැතුවාමත් නෙවෙයි.**

**කුඩා දරුවන් සමග ගෙවන ජීවිතය ලේසි නැතුව ඇති?**

හරිම සුන්දරයි ඒ ගෙවන කාලය. මගේ රඟපෑම ගැන කියන දේවල් අහනකොට මට උගන්වන්න කාලයක් නැහැ. විශේෂයෙන් මම ඒ දරුවන්ගේ මවුපියන් දැනුවත් කරලා තිබුණා මම රඟපාන නිර්මාණ කුඩා දරුවන්ට නරඹන්න දෙන්න එපා කියලා. පසුගිය කාලේ මම රඟපාපු 'සකර්ම' ටෙලිනාට්‍යයේ රඟපෑවේ ගැබිනි අම්මා කෙනකුගේ චරිතයක්. ඉතින් පොඩි අයට තිබුණු ප්‍රශ්නය ටීචර්ට බබා හම්බවුණාද කියන එක. ඇයි ටීචර්ගේ බබා එක්කගෙන ආවේ නැත්තේ කියලා අහනවා. ඔය වගේ ප්‍රශ්න. ඉතින් මම කොහොමද කියන්නේ පොඩි අයට මගේ රඟපෑමක් කියලා. ඒ අයට ඒක තේරුම් ගන්න බැහැනේ. ඒ නිසාමයි මම කිව්වේ මම රඟපාන ටෙලිනාට්‍ය බලන්න දෙන්න එපා කියලා. ළමයි උදේට දකිනවා මගේ බඩක් නැහැ කියලා. ඒ දරුවන් රෑට දකිනවා මට බබෙක් ලැබෙන්න ඉන්නවා කියලා. ඊට පස්සේ ඒක බලලා ප්‍රශ්න අහනවා මගේ බඩ ගැන.

**ඒ නිසාම චරිතවලට විශේෂ අවධානයක් යොමුකරනවා?**

ශිල්පීන්ට කියන්න පුළුවන් චරිත තෝරාගන්න බැහැ කියලා. නමුත් මම ගුරුවරියක් ලෙස කටයුතු කරන්නේ කුඩා දරුවන් සමග. පාසලේ ඉන්නවා ලොකු දරුවොත්. මට හමුවෙන්නේ කුඩා දරුවන් විතරක් නෙවෙයි. පාසලේ සියලු දරුවන් මට හමුවෙනවා. එතකොට මට පාසලේ කිසිම දරුවෙක්ට අවවාදයක් දෙන්න බැහැ. මගේ රංගනයේ චරිතවල වෙනස් හැසිරීම් ස්වභාවයක් තිබුණොත්. දරුවෙක්ගේ විනය ගැන කතාකරන්න බැහැ එහෙම වුණොත්. මම ඔවුන්ට ආදර්ශයක් වෙන්න ඕනේ. ඒ නිසා යම් සීමාවක් තුළ මට වැඩකරන්න සිදුවෙනවා රංගන කටයුතුවලදී.

**වසන්ත විතාරණගේ**




**ප්‍රියන්ත අයියා වැඩේදි සැරයි...**



# ස්වභාවික විපත් ගැනත් ප්‍රවේසමෙන්

## රට මැද හදිසි අනතුරු

## ජලයෙනුත් බාධා කරදර

## ලග්න රැසකට නොසිතූ ලැබීම්

මව්රට දැන් ඉරිදා 2026 ජූලි 26

# කේන්දරේ

ගලපන ගැලපෙන තැන...

**2026.07.26 වැනිදාට ග්‍රහ ලොව ප්‍රබලයකු ලෙස සැලකෙන සෙනසුරු හෙවත් ශනි සිය සාමාන්‍ය ගමන වෙනස් කර වක්‍ර ගමනක් පෙන්නුම් කරනවා. ඒ අනුව සමස්ත ලෝකයමත් ලෝකයට සහ රටටත් ලග්න වශයෙන් ගත් විට ඔබටත් සුවිශේෂ සුබ අසුබ තත්ත්වයන් රැසකට මුහුණ දීමට සිදුවේ.**

### හොඳට හොඳ - නරකට නරක

# ග්‍රහ ලොව තීන්දුකාරයා

# ගන්න බැරි වූ දේ ගන්න

# දෙන්න බැරි වූ දේ දෙන්න

# ආපසු හැරී බලයි...

සෙනසුරු ග්‍රහයා තත්පරයට සැතපුම් 6ක වේගයෙන් ගමන් කරන අතර සෙනසුරු හිරුගෙන් සැතපුම් කෝටි 88ක් දුරින් පිහිටා තිබෙන ග්‍රහයෙකි.

ග්‍රහයකු වක්‍ර වීවේදී එම ග්‍රහයා දෙන පල අඩුවැඩි සහ සුබ අසුබ ලෙස විවිධ වෙනස්කම් සිදුකරයි. ශුභ ග්‍රහයන් වක්‍ර වූ විට ශුභ ඵලද, අශුභ ග්‍රහයන් වක්‍ර වූ විට අශුභ ඵලද දෙන්නට සමත් වෙයි. කෙසේ නමුත් බහුතරයක් ජ්‍යොතිෂවේදීන් නෛසර්ගික වශයෙන් සුබ අසුබ ග්‍රහයන් ගැන බලා වක්‍රයේදීත් පලාපල කියයි. එහෙත් මෙහිදී ඒ ඒ ලග්න අනුව ශුභ අශුභ ග්‍රහයන් බලා වක්‍රයේ පලාපල කීමට කල්පනාකාරී විය යුතුය.

ඒ අනුව සෙනසුරුගේ මෙම වක්‍ර වීම ලෝකයට කෙසේ බපලාන්නේදැයි විමසීමේදී ලෝකයේ මෙතෙක් පැවැති සන්සුන් සාමකාමී පරිසරය වෙනස් වීමක් සිදුවේ. විශේෂයෙන්ම බලය සම්බන්ධ බරපතළ ආරංචි ලෝකයේ විවිධ තැන්වලින් අසන්නට ලැබෙන අතර, විශාල විපත් හා ජීවිත හානි පිළිබඳ සිදුවීම් වාර්තා වන කාලයක් බවද පෙන්නුම් කෙරේ. ජල ගැලීම් හෝ නායයෑම් සම්බන්ධ පුවත් හේතුවෙන් ඇතැම් රටවල ජන ජීවිත අකර්මණ්‍ය විය හැකි කාලයකි. ඒ පිළිබඳ අවධානය වැදගත්ය. ලෝකයේ ප්‍රසිද්ධියට පත් වැඩිහිටි පුද්ගලයකු හෝ ප්‍රභූ පුද්ගලයකු පිළිබඳ ශෝකජනක පුවතක් අසන්නට ලැබෙනු ඇත. එමෙන්ම ලෝකයේ ප්‍රබල නායකයකුගේ බලයට අභියෝග කෙරෙන සිදුවීමක් අසන්නට ලැබෙනු ඇත.

සමේ රෝගයක් හෝ ඒ හා සමාන රෝග තත්ත්වයක වර්ධනයක් ගැන ලෝකය තුළ කතාබහක් ඇතිවේ. ගිනිඅවි, ඉන්ධන, ගෑස් හෝ වායුව සම්බන්ධ ආන්දෝලනයක් ලෝකය තුළ යළිත් හිස එසවීමේ තත්ත්වයක්ද පෙන්නුම් කෙරේ.

තාක්ෂණික අංශයේ නව පිබිදීමක් ආන්දෝලනයට ලක්කරමින් ඉස්මතු වන අභියෝග යක් සම්බන්ධව ප්‍රබලව කතාබහක් ඇතිවේ. එයින් ලොව රටවල් රැසක් අපහසුතාවට පත්වීමට ඉඩ ඇත.

කෙසේ නමුත් සෙනසුරුගේ වක්‍ර වීමෙන් රට තුළ සාමකාමී මෙන්ම ජනතාවට හානිකර ස්වභාවයක් පෙන්නුම් කෙරෙනු ඇත. ආර්ථිකයේ යම් නිහඬතාවක් හෝ පීඩාකාරී බවෙන් නිදහස් වූ ස්වභාවයක් පෙන්වයි. නැවතී තිබූ වැඩකටයුතු ක්‍රියාත්මක වීමක් මෙන්ම ධනාත්මක තත්ත්වයක්ද පෙන්වයි. මූල්‍ය අංශයේ යම් පිබිදීමක්, විදෙස් ආධාර හෝ උපකාර ගලා ඒමක් පෙන්නුම් කරයි.

මෙතෙක් කලක් තීන්දු තීරණ නොගත් යම් යම් කාරණා පිළිබඳ තීන්දු තීරණ ගන්නට සුදුසු වටපිටාවක් ගොඩනැගෙන කාලයකි. එහෙත් රට තුළ ප්‍රදේශ කිහිපයකට ජලයෙන් බාධා සිදුවිය හැකි කාලයකි. ස්වභාවික විපත් අවදානම සහිත ප්‍රදේශවල වැසියන් ප්‍රවේසමෙන් කටයුතු කිරීම ඉතා යහපත්ය. රට මැදට වන්නට බරපතළ ස්වභාවික විපත් සහ හදිසි අනතුරු තත්ත්ව ගැන පුවත් අසන්නට සිදුවන තත්ත්වයක් ඇති නිසා ජනතාව ප්‍රවේසම් වීම වැදගත්ය. ඉගෙනගන්නා හෝ අධ්‍යාපනයට සම්බන්ධ පිරිස් අනතුරුදායක ක්‍රියාවලින් වැළකී සිටීමද යහපත්ය.

අධ්‍යාපන අංශයේ විවිධ දක්ෂතා පිළිබඳ පුවත් අසන්නට ලැබෙනු ඇත. එසේම දරුවන් සම්බන්ධව සංවේදී සිදුවීම්වලට ඉඩ ඇති නිසා මවුපියන් සිය දරුවන් ගැන අවධානයෙන් සිටීම ඉතා වටී.

කෙසේ නමුත් සෙනසුරු වක්‍රය ලග්න වශයෙන් ගත් කල ඒ ඒ අයට බලපාන ආකාරය විමසීමේදී විශේෂ කාරණයක් කිව යුතුය. එනම් ඇතැම් විට බහුතරයක් දෙනාට සෙනසුරු වක්‍රයෙන් අසුබයි කියා සිතා සිටියද තම තමන්ගේ උත්පත්ති ග්‍රහ තත්ත්ව හරි හැටි හඳුනාගෙන ඒ අනුව කටයුතු කළහොත් නිසැකවම සෙනසුරු වක්‍ර වීම තුළින් ජීවිතයේ ජයග්‍රහණය උරුම කරගන්නට බහුතරයක් දෙනාට හැකිවනු ඇත. ඒ නිසා මෙම පලාපලය පොදු ලග්න පලාපලයක් බැවින් තම තමන්ගේ කේන්දර දක්ෂ, අවංක ජ්‍යොතිෂවේදියකු ලවා පරීක්ෂා කරවාගෙන මෙම ශනි වක්‍රයෙන් ඔබගේ ජයග්‍රහණයට අවශ්‍ය මාවත විවර කරගත හැකි බවද සිහිපත් කරමි.

**මේෂ**

## සුවිශේෂ ලැබීම්

මෙතෙක් කලක් පැවැති යම් යම් බාධා කරදර වේ නම් ඒවායෙන් නිදහස සහ සහනය ලැබේ. එමෙන්ම නිවාස අයිතිවාසිකම්, ශරීර සනීපය මෙන්ම විවිධාකාර වූ සතුටුදායක සිදුවීම්වලට හේතු යෙදේ. සමිති සමාගම් හා ආයතනවල ප්‍රධාන තනතුරු, රැකියා උසස්වීම් මෙන්ම ගෞරවයටද හේතු යෙදේ. තම බලය වර්ධනය කරගන්නට අවස්ථාව උදාවන අතර විශේෂ දියුණුවකටද ඉඩ ලැබේ. පවුලේ පිරිස වැඩිකෙරෙන කාලයකි. බලාපොරොත්තු නොවූ ධන ලාභ සහිත කාලයකි. මෙතෙක් කලක් ලැබේ යැයි සිතා සිටි විශේෂ ලැබීම් හිමිවනු ඇත. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා තර කෙරෙන අතර කම්සැප වර්ධනයට හේතු යෙදේ. ඉතා වාසනාවන්ත තීරණාත්මක කාලයකි.

**වෘෂභ**

## විශේෂ වාසි

වෘෂභ ලග්න හිමියන්ගේ යෝග කාරක මෙන්ම සුබ ග්‍රහයකුද වන ශනිගේ වක්‍ර වීමෙන් ඉදිරි කාලය තුළ සුවිශේෂ ජයග්‍රහණ අත්කර ගන්නට වාසනාව ලැබේ. ඒ අනුව මෙතෙක් කලක් බලාපොරොත්තුව සිටි විශේෂ කාරණාවකින් නොසිතූ විරූ ජයග්‍රහණයක් ලැබේ. විශේෂයෙන්ම ඉගෙනගන්නා දරුවන්ට, විශේෂ ජයග්‍රහණ හිමිවනු ඇත. රැකියා කරන අයට තනතුරු උසස්වීම් හිමිවේ. නව ආදායම් මාර්ග විවර වනු ඇත. එසේම සමාජය තුළ කැපීපෙනෙන කවුරුත් කතාබහ කරන ආකාරයේ අයකු ලෙස ප්‍රසිද්ධියට පත්වේ. සුවිශේෂ ලැබීම් සහිතය. තම බලපරාක්‍රමය පෙන්වීමට අවස්ථා යෙදේ. සතුරන් පරාජය වනු ඇත. පෙර තිබූ ලෙඩ රෝග සුවවීමෙන් සිතේ සතුටට හේතු යෙදීමටත් නියමිතය. විශේෂ ගමන් බිමන් මෙන්ම විශේෂ වාසිද අත්වනු ඇත.

20 පිටුවට

# ඔබට හොඳද නරකද?

**සෙනසුරු වක්‍රයෙන් ඔබට ලැබෙන සුබ පල වැඩිකර ගැනීමටත් අසුබ පල අඩුකර ගැනීමටත් කාක නිලක් යෙදූ මුදුවක් හෝ මාල පෙත්තක් නිසි ලෙස ඔබගේ නමට ලග්නයට බලගන්වා පැලඳීමත්, නුග වෘක්ෂයකට සාත්තු කිරීමත්, බුද්ධ මන්ත්‍ර සහිත තඹ බෝ පත්‍ර හතක් ඔබගේ නමට ලග්නයට බලගන්වා බෝධි පූජාවක් තැබීමත් ඉතා යහපත්ය. ඉගෙන ගන්නා දරුවන්ට ව්‍යාපාරිකයන්ට සහ වැඩිහිටියන්ට මෙම ප්‍රතිකර්ම කරවා ගැනීම ඉතා වටී. විශේෂයෙන් විභාග කටයුතු කරන දරුවන්ට මෙම ප්‍රතිකර්ම ඉතා වැදගත් වනු ඇත.**

## මිථුන

### වියදම පරිස්සමෙන්

නිසැකවම තමා සිටින තැන හෝ පදිංචිය වෙනස් කිරීමට සිදුවනු ඇත. ධන ලාභ මෙන්ම හදිසි ලැබීම් යෙදුණද එම මුදල් රඳවා ගන්නට අපහසු වන බැවින් කල්පනාකාරී වන්න. එක් පැත්තකින් සිතේ සතුටට හේතු යෙදුණද කලබල තීන්දු ගැනීමෙන් පාඩු විය හැකිය.

පපුවේ, බෙල්ලේ වේදනා ඇතිවන අතර, ඉතා පරෙස්සමට කටයුතු කළ යුතු කාලයකි. පාදවල හෝ උරහිස් අසල යම් යම් ආබාධ යෙදේ. හිතවතුන්ගෙන් විවිධ ආරාධනා ලැබේ. තමන්ගේ කෙනකු ගැන උනන්දු වීමට සිදුවන අතර දුරබැහැර සිටින අයකු ඔබ සොයා පැමිණේ. තරග, වාද විවාද ආදියට යෑම සුදුසු නැත. පව් කරන්නට සිතේ. රැකියා ස්ථානයේ සිටින හිතවත් පිරිසක් ඔබට එරෙහිව කේලාම් ඔපාදූප කියන්නට ඉඩකඩ ඇත. අන් අයගේ සිත් රිදෙන වචන පිටවන කාලයකි.

## කටක

### උත්සාහයේ තරමට ප්‍රතිඵල

කලබලයකින් තොරව වැඩ කළහොත් අරමුණු පහසුවෙන් ජයගත හැකිය. එහෙත් සත්‍ය අවබෝධ කරගැනීමට යම් යම් බාධා යෙදේ. ඉඩකඩම්, දේපළ සම්බන්ධ ලැබීම් ඇත. විශේෂ මූල්‍ය ලාභ සඳහා අවස්ථා උදාවේ. ගමන් බිමන්වලදී ප්‍රවේසම වැදගත් වේ. සුළු සුළු බාධා තත්ත්වයන් හඳුනාගෙන ඒවා මගහැර කටයුතු කළහොත් ඉතා පහසුවෙන් අරමුණු ජයගත හැකිය. රැකියා කරන අයට ප්‍රධානීන් සමග මත ගැටුම් ඇතිකෙරේ. එසේම ඒ නිසා ප්‍රවේසම වැදගත්ය.

පැරැණි භාණ්ඩයක් හෝ පැරැණි ගනුදෙනුවකින් යළි ලාභ ලැබිය හැකි කාලයකි. උසස් අය සමග කතාබහ ගනුදෙනු ප්‍රවේසමෙන් කළ යුතුය. මෙතෙක් කල් ඔබට අවශ්‍යව තිබූ භාණ්ඩයක් මිලට ගැනීමට අවස්ථාව යෙදේ. බලාපොරොත්තු ඉටුකරගැනීමට උත්සාහ කරන්න.

## සිංහ

### අමුතු අදහස්

ගමන් බිමන් අධික කෙරෙන කාලයකි. ඇතැම් විට ඒ නිසාම පාඩු සහ බාධාද සිදුවනු ඇත. පුරුෂයන්ට ස්ත්‍රීන් සමගද, ස්ත්‍රීන්ට පුරුෂයන් සමගද සබඳතා ඇතිවේ. අමුතු අදහස් ඇතිවන අතර ඒවා ක්‍රියාත්මක කිරීමටද ඉඩ ලැබේ. උදරාබාධ මෙන්ම මුත්‍රා සම්බන්ධ අපහසුතා ඇතිවිය හැකි කාලයකි. මහජනයා සමග සම්බන්ධ වී කටයුතු කරන්නට ඉඩ ලැබේ. ඇතැම් විට විශාල පිරිසක් සම්බන්ධ කටයුත්තකින් ලොකු වාසියක් අත්වනු ඇත. විශේෂ අයගෙන් අමුත්තන්ගෙන් වාසි ප්‍රයෝජන ලැබේ. නව රැකියා ලබාගැනීමට සහ ඉල්ලුම් කිරීමට සිතෙන කාලයකි. ආහාර සම්බන්ධ කාරණා මත අසනීප යෙදෙන කාලයකි. ප්‍රවේසම් විය යුතුය. විශේෂයෙන් තමාගේ සමීපතමයෙක් හෝ ඥාතියෙක් කලකට පසු හමුවනු ඇත.

## කන්‍යා

### වාසනාව අත ළඟට

සතුරන් පරදා ජය ගන්නට හොඳ කාලයකි. මෙතෙක් කාලයක් ඔබට සතුරුකම් කළ අයට අලාභ සහ පාඩු සිදුවන කාලයකි. ලෙඩ රෝග තිබුණේ නම් ඒවායෙන් සුවය ලැබෙන කාලයකි. ස්ත්‍රී පුරුෂ සබඳතා තරවන අතර, නව හිතවත්කම් ඇතිවන කාලයකි. දේපළ ඉඩකඩම්වලින් වාසි හා ලාභ අත්වේ. නව දියුණුවකට මග පෑදෙනු ඇත. අනියම් සබඳතා කෙරෙහි අවස්ථා යෙදෙන බැවින් බුද්ධිමත්ව කටයුතු කරන්න.

වෙළෙඳ ව්‍යාපාරවලින් ලාභ ලැබෙන අතර, නව ව්‍යාපාර ආරම්භයට ඉතා සුබ කාලයකි. තමාට අහිමිව ගිය බොහෝ දේ යළි ලැබෙන කාලයකි. විශේෂයෙන්ම සබඳතා, රැකියා හා ධනය සම්බන්ධ එවැනි ලැබීම් ඇතිකෙරේ. තම කැමැත්ත පරිදි කටයුතු කිරීමට අවස්ථාව යෙදේ.

## තුලා

### නව ව්‍යාපාර

ඇතැම් කටයුතු හදිසියේ වෙනස් කිරීමට සිදුවන ග්‍රහ තත්ත්වයකි. එහෙත් ඉන් සිදුවන යහපත වැඩි කරගත හැකිය. ව්‍යාපාර කරන අයට නව ව්‍යාපාර හා ආයෝජන සඳහා උත්සාහ කළ හැකිය. දරුවන් ගැන අවධානයෙන් සිටිය යුතුය. එමෙන්ම දරු ප්‍රසූතියට සිටින ස්ත්‍රීන් සහ අනතුරුදායක කටයුතුවල යෙදෙන පිරිස් අවධානයෙන් සිටිය යුතුය.

ඉගෙන ගන්නා දරුවන්ට අමුතු අමුතු දේ ඉගෙනීමටත් නව පාඨමාලා ආරම්භයටත් සුබ වේ. ගමන් බිමන්වලදී විශේෂ ධන යෝගයක් පෙන්නුම් කරන අතර ඉන් සිය බලාපොරොත්තු ඉටුකර ගැනීමට අවස්ථා යෙදේ. දුරබැහැර සිටින අයකුගේ ආරාධනාවක් මත හදිසි ගමනක් යෙදේ. ඉන් ජීවිතයේ තීරණාත්මක වෙනසක් සිදුවේ. අන් අය සමග කරන කටයුතු ප්‍රවේසමෙන් කළ යුතුය.

## වෘශ්චික

### අමුත්තෙකුගෙන් ලාභ

ඉඩකඩම් සම්බන්ධ කතාබස් ගනුදෙනු වැඩිකෙරෙන කාලයකි. ගෙවල් දොරවල් අලුත්වැඩියාවට ඉඩකඩ ලැබෙන අතර මෙතෙක් කාලයක් තමාට තිබූ ප්‍රශ්න සම්බන්ධව අලුතින් සිතන්නට සිදුවනු ඇත. ඇතැම් විට එම කාරණා තමාට වාසිදායක ලෙස විසඳා ගන්නටද ඉඩකඩ ලැබේ. තමාට සමීප ඥාතියකු හෝ මිතුරෙකු දුරස් වීමක් සිදුවනු ඇත. ආදායම් මාර්ග වෙනස් කරන්නට සිතෙන කාලයකි. එසේම නව ගනුදෙනු සහ සැලසුම් තුළින් විශේෂ වාසි අත්වේ.

තමාට සමීප අයගේ සතුරු ක්‍රියා පිළිබඳ අවධානයෙන් සිටින්න. නැතහොත් ඔබට අවාසි වනු ඇත. පාදයේ හෝ උරහිසේ ආබාධයක් සඳහා ප්‍රතිකාර ගන්නට සිදුවේ. ගැටීම් වැටීම් සහිත කටයුතුවලින් ආරක්ෂා වීම වැදගත්ය. අමුත්තෙකුගෙන් ලාභ ලැබෙනු ඇත.

## ධනු

### ජයපිට ජය

ඉතා වාසනාවන්ත ග්‍රහ තත්ත්වයකි. හදිසි ධන ලාභ මෙන්ම සැප සම්පත් ලැබෙන කාලයකි. සිතේ සතුට ඇතිවේ. ප්‍රීතියට කරුණු යෙදේ. ශරීර සනීපය මෙන්ම අලුතින් ආරම්භ කරන කටයුතුවලින්ද වාසි අත්වේ. උසස් සහ ප්‍රභූ පුද්ගලයන් ආශ්‍රයට අවස්ථාව යෙදෙනු ඇත. අසනීප තිබුණේ නම් සුවය ලැබෙනු ඇත. නිවසට සුරතල් සතුන් ගෙන එන්නට සිදුවන අතර, සතුන් සම්බන්ධ ව්‍යාපාර කරන අයට විශේෂ වාසි අත්වේ. උත්සවයකට යන්නට සිදුවන අතර ඉන් විශේෂ වාසි අත්වේ. නොසිතූ තරමේ ලොකු ලාභ ලැබෙන්නට හැකි කාලයකි. නැතිවූ නම්බුව තනතුරු තානාන්තර ආදිය ලැබෙනු ඇත. නීති ප්‍රශ්නවලින් සහ දෝෂාරෝපණවලින් නිදහස ලැබේ. ඉතා හොඳ කාලයකි.

## මකර

### අවධානය වැදගත්

තමාගේ පෙනුම සහ සිරුරේ ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් විය යුතු කාලයකි. ණය ගනුදෙනු සහ එවැනි කටයුතුවලින් මුදල් ලැබේ. එහෙත් එවැනි මුදල් ගන්නට පෙර සිතාබලා තීරණ ගන්න. තමාට නොගැළපෙන අය ආශ්‍රයට නොයා යුතු කාලයකි. පවුලේ ඥාතීන් සමග අවුල් වියවුල් ඇතිවිය හැක. ඒ නිසා ප්‍රවේසම් වන්න. බොරු චෝදනා නින්දා අපහාස අසන්නට සිදුවිය හැකි බැවින් ප්‍රවේසම් වන්න.

තමාගේ කීර්තිනාමය ගැන අවධානයෙන් කටයුතු කළ යුතුය. මුහුණේ සහ සිරුරේ තැන තැන ලප කැළැල් ඇතිවේ. ඔබද ගැටෙන වැටෙන කෙටෙන කටයුතුවලින් ප්‍රවේසම් වෙන්න. ඔබට අයත් දෙයක් අස්ථානගත වීමක් සිදුවනු ඇත. ඒ ගැන සැලකිලිමත් වන්න.

## කුම්භ

### පැරැණි ගනුදෙනුවකින් වාසි

ඔබ තරමක් කල්පනාවෙන් කටයුතු කළහොත් ග්‍රහ අපල තත්ත්වය මගහරවාගෙන ඉතා පහසුවෙන් ජයග්‍රහණය කරන්න අවස්ථාව උදාකරගත හැකිය. එසේම කලකට පෙර කළ කටයුත්තක ලාභය ඔබට ලැබෙන කාලයකි. විටින් විට පාදවල ආබාධ සහ උදරය ආශ්‍රිත අපහසුතා යෙදෙනු ඇත. තමාගේ අවශ්‍යතාවට තිබූ දෙයක් වෙනත් අයකුට දීමට සිදුවනු ඇත. අසනීප සම්බන්ධ රෝග ඇතිකෙරේ.

හදිසි ලොතරැයි ලාභ සහ වාසි ලැබේ. වැඩිහිටි අය සමග කටයුතු ප්‍රවේසමෙන් කළ යුතුය. තමාගේ යැයි සිතා සිටි දෙයක් අන් අයකු වෙනුවෙන් ලබාදීමට සිතේ. හදිසියේ පැමිණෙන අමුත්තෙකු සමග දුර ගමනක් යෙදේ. තැන්පත් ධනය වැයවනු ඇත.

## මීන

### සතුටට හේතු

මීන ලග්න ඔබට මෙතෙක් කලක් තිබූ බාධා ඉවත්ව නව ගමනක ඉඩ ප්‍රස්ථා යෙදේ. නව ආදායම් මාර්ග විවර කෙරෙන අතර වැඩිහිටි පුද්ගලයන් හා මිතුරන්ගෙන් උපකාර ලැබේ. නව ව්‍යාපාර මෙන්ම තාක්ෂණික අංශයට සම්බන්ධ කාරණාවලින් නව ලැබීම් ඇතිකෙරේ. සබඳතා තර කෙරෙන අතර දරුවන් සම්බන්ධ කටයුතුවලින් වාසි අත්වේ.

ඔබට සතුරුකම් කළ අයම ඔබව සොයා එනු ඇත. අහිමි වූ රැකියා ලැබීම් හෝ නව රැකියා සඳහා අවස්ථා යෙදේ. උසස් තනතුරු සමග ඉහළ වැටුප් ලැබීම් සිදුවන කාලයකි. නව ව්‍යාපාර සැලසුම් සහ නව නිෂ්පාදන සඳහා අවස්ථා ඇත. එසේම ගමන් බිමන් බහුල කෙරේ. හිතේ සතුටට හේතු යෙදේ.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී**
**ජ්‍යොතිෂ පර්යේෂක**
**ජ්‍යොතිෂ පුවත්පත් රැසක**
**හිටපු ප්‍රධාන කර්තෘ**
**ජේ.එන්.කේ. රත්නායක**
**0777579404**